**ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව - 2014**

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනතේ 34 වන වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර කොමිෂන් සභා වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැළසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව්කිරීම්වලට උපකාරිවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක - 08

ඉකුත් වර්ෂය සඳහා කරන ලද ගැලපුම් රු.1,803,936 ක් අතීතානුයෝගී ගැලපීම වෙනුවට සමුච්චිත අරමුදලට ගලපා තිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

විදුලි බලය මිලදී ගැනීමේ ගිවිසුම සම්බන්ධ පුහුණු පාඨමාලාව සමාලෝචිත වර්ෂයේදී පැවැත්වීමට කටයුතු කර නොතිබුණු අතර 2015 වර්ෂයේදී පවත්වන ලද පාඨමාලාවේ වියදම රු.4,995,754 ක් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

#### 2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

සමාලෝචිත වර්ෂයේදී පරිගණක හා කාර්යාල උපකරණ සහ ලී බඩු හා සවිකිරීම් යන විෂයයන් දෙකක් සම්බන්ධයෙන් ලෙජර ගිණුම් හා ස්ථාවර වත්කම් උපලේඛන අතර පිළිවෙලින් රු.865,462 ක් හා රු.59,189 ක පිරිවැය වෙනසක්ද, ක්ෂය වෙන් කිරීම් සම්බන්ධව පිළිවෙලින් රු.340,376 ක් හා රු.61,783 ක වෙනසක්ද නිරීක්ෂණය විය.

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ලිහිසිතෙල් නියාමනය වෙනුවෙන් කොමිෂන් සභාව සමඟ එළඹෙන ලද ගිවිසුම්වලට අනුව විචලා ලියාපදිංචි ගාස්තු අර්ධ වාර්ෂිකව ඊලඟ මාසයේ දින 30 ක් ඉක්මවීමට පෙර ගෙවිය යුතු වුවද, 2012 හා 2013 වර්ෂයන්ට අදාළව එක් ආයතනයක් විසින් රු.793,512 ක්ද, සමාලෝචිත වර්ෂයට අදාලව ආයතන 03 ක් රු.8,211,265 ක්ද වශයෙන් එකතුව රු.9,004,777 ක් 2014 දෙසැම්බර් 31 දින වන විටද කොමිෂන් සභාවට ලැබී නොතිබුණි.

(ආ) විදුලිබල උත්පාදන බලපත්‍රලාභීන් වෙත නිකුත් කරනු ලබන, උත්පාදන බලපත්‍රයේ කොන්දේසි අංක 11 ප්‍රකාර අදාළ වර්ෂයේ ජූනි 30 දිනට හෝ ඊට පෙර දිනයකදී හෝ ජාතික විදුලි බල පද්ධතියට විදුලිය සැපයීම ආරම්භ කළ දිනයේ සිට දින 30 ක් ඇතුළතදී හෝ වාර්ෂික නියාමන ගාස්තු කොමිෂන් සභාවට ගෙවිය යුතු වුවද, 2012, 2013, 2014 යන වර්ෂවලදී පිළිවෙලින් රු.12,000 ක්, රු.104,000 ක් හා රු.39,132,900 ක් වශයෙන් එකතුව රු.39,248,900 ක් 2014 දෙසැම්බර් 31 දින වන විට ලැබී නොතිබුණි.

**2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2013 සැප්තැම්බර් 01 දිනැති අංක (Sec/2013/07 ) දරන දේශීය ආදායම් බදු චක්‍රලේඛයේ 3 (i) ඡේදය | බද්දට යටත් පාරිශ්‍රමිකය වශයෙන් මෙම චක්‍රලේඛයට අනුව වැටුප්, දීමනා, අතිකාල ගෙවීම්, ගාස්තු ආදි මුදලින් කරන ලද ගෙවීම් ඇතුළත් විය යුතු වුවද, කොමිෂන් සභාව විසින් දීමනා සැලකිල්ලට නොගෙන මූලික වැටුප් ප්‍රමාණය පදනම් කරගෙන උපයන විට ගෙවීම් බදු ගණනය කර තිබුණි. |
| (ආ) | 2000 ජනවාරි 31 දිනැති අංක පීඑෆ්/පීඊ/6 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 24 ඡේදය | ඉකුත් වර්ෂවලදී මෙන්ම සමාලෝචිත වර්ෂයේදීද සේවකයින් විසින් ගෙවිය යුතු රු.1,307,275 ක් වූ උපයන විට ගෙවීම් බදු කොමිෂන් සභාවේ අරමුදල් වලින් ගෙවා තිබුණි. |
| (ඇ) | 2011 නොවැම්බර් 16 දිනැති අංක 24/2011 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 05 ඡේදය | අවුරුදු 60 ට වැඩි නිලධාරින් සේවයේ යොදවා ගැනීමේදී චක්‍රලේඛ විධිවිධාන අනුව මහා භාණ්ඩාගාරයේ එකඟතාව ලබා ගැනීමට ක්‍රියාකර නොතිබුණි. |
| (ඈ) | 2007 ඔක්තෝබර් 02 දිනැති අංක පීඊඩී - 45 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදි හා ඉදිරිපත් කිරීමේදි අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම දැක්වෙන ප්‍රකාශනයක් ගිණුම්වල දැක්විය යුතු වුවත් එසේ කර නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා කොමිෂන් සභාවේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.24,670,710 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේදී රු.14,707,789 ක අතිරික්තයක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.9,962,921 ක වැඩිවීමක් දක්නට ලැබුණි. සමාලෝචිත වර්ෂය තුල මෙහෙයුම් වියදම් රු.39,812,914 කින් වැඩි වී තිබූ අතර ඒ සඳහා පෞද්ගලික පඩිනඩි රු.8,607,439 කින්ද උපදේශන සේවා ගාස්තු රු. 14,250,528 කින් හා ගිවිසුම් ගත සේවා රු.13,626,074 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබූ අතර ඊට සාපේක්ෂව ලිහිසි තෙල් අලෙවිකරන්නන්ගෙන් අය කරනු ලබන රු.6,421,975 ක් හා විදුලිය නියාමනය වෙනුවෙන් ලංකා විදුලි බල මණ්ඩලයෙන් හා ලංකා විදුලි බල (පෞද්) සමාගමෙන් (LECO) ඇතුළු පෞද්ගලික විදුලිය නිපදවන්නන්ගෙන් අය කරනු ලබන වාර්ෂික නියාමන ගාස්තු රු.48,432,150 ක් වැඩිවීම ඉහත අතිරික්තය ඇතිවීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනත මගින් මහජන උපයෝගිතා සේවාවන් වන ජලය, විදුලිය හා ඉන්ධන නියාමනය කිරීම සඳහා මහජන උපයෝගිතා කොමිෂන් සභාව පිහිටුවා ඇති අතර මේ වන විට 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලි බල පනත මගින් විදුලිය නියාමන කටයුතු සහ 2006 අප්‍රේල් 05 දින පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයකින් ඛනිජ තෙල් කර්මාන්තයේ ලිහිසි තෙල් නියාමන කටයුතු පමණක් කොමිෂන් සභාව විසින් සිදු කරනු ලබයි. කොමිෂන් සභාව විසින් ජලය හා ඛනිජ තෙල් කර්මාන්තයට අදාල පනත් සංශෝධනය කිරීම සම්බන්ධයෙන් අදාල අංශ දැනුවත් කර තිබුණද මේ වන තෙක් අදාල සංශෝධිත පනත් අනුමත නොවීම නිසා එම කර්මාන්තවල නියාමන කටයුතු ඉටු කිරීමට කොමිෂන් සභාවට නොහැකි වී තිබුණි.

(ආ) 2009 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා විදුලි බල උත්පාදන, සම්ප්‍රේෂණ හා බෙදා හැරීමේ බලපත්‍ර ලබා ගැනීම සඳහා කොමිෂන් සභාව වෙත අයදුම්පත් 311 ක් ලැබී තිබුණු අතර ඉන් බලපත්‍ර 220 ක් නිකුත් කර තිබුණි. මේ අනුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට අයදුම්පත්‍ර 91 ක් සඳහා බලපත්‍ර ලබාදී නොතිබුණු අතර ඒවා අතරින් අයදුම්පත් 78 ක් අදාල අමාත්‍යාංශය වෙත අනුමැතිය සඳහා යොමුකර තිබුණු අතර අයදුම්පත් 13 ක් අදාල අවශ්‍ය රෙගුලාසිවලට අනුකූල නොවීම නිසා ඉතිරි වී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා කොමිෂන් සභාවට ලැබුණු මහජන පැමිණිලි සංඛ්‍යාව හා එම පැමිණිලිවලට කොමිෂන් සභාව මැදිහත්කරුවකු ලෙස ක්‍රියාකිරීම පිළිබඳ විස්තර පහත දැක්වේ.

| පැමිණිලි වර්ගය | ලැබුණු ප්‍රමාණය | | පහසුකම් සපයන ලද ප්‍රමාණය | |
|---|---|---|---|---|
| | 2013 | 2014 | 2013 | 2014 |
| විදුලි බිල්පත් සහ මනු | 342 | 365 | 342 | 365 |
| පාරිභෝගික කාණ්ඩය | 99 | 96 | 98 | 96 |
| රැහැන් මංපෙත් | 750 | 545 | 750 | 545 |
| නව සම්බන්ධතා | 227 | 150 | 227 | 150 |
| විසන්ධි කිරිම හා නැවත සම්බන්ධ කිරිම | 108 | 67 | 107 | 67 |
| වෙනත් | 221 | 530 | 221 | 530 |
| දිස්ත්‍රික් ලේකම්වරුන්ගෙන් ලැබුණු ලිපි | 320 | 160 | 319 | 160 |
| පසුගිය වර්ෂයෙන් ඉ/ගෙනා | - | 03 | - | 03 |
| මුළු ගණන | 2067 | 1916 | 2064 | 1916 |

2014 වර්ෂයේදී කොමිෂන් සභාවට ලැබෙන සියලුම මහජන පැමිණිලි සඳහා පහසුකම් සලසන ලද බව දක්වා තිබුණද මේ සම්බන්ධව කරන ලද විගණනයේදී පැමිණිලි සම්පූර්ණයෙන් නිරාකරණය වී නොතිබුණු බව ලිපිගොනු අනුව නිරීක්ෂණය විය. මේ අනුව විදුලි බල පනතේ 39 වන වගන්තිය හා කොමිෂන් සභා පනතේ 17 (එ) වගන්තිය ප්‍රකාර බලාපොරොත්තු වූ අරමුණු ඉටුවන බවට විගණනයේදී අනාවරණය නොවීය.

(ඈ) කොමිෂන් සභාව විසින් පිළියෙල කරන ලද වාර්ෂික වාර්තාව ප්‍රකාරව 2013 හා 2014 වර්ෂ තුළදී පුනර්ජීවනීය බලශක්ති සංවර්ධන ව්‍යාපෘති සඳහා නිකුත් කරන ලද බලපත්‍ර හා ඒවායේ විදුලි බල උත්පාදන ධාරිතාවයන් පහත දැක්වේ.

| තාක්ෂණය | 2013 වර්ෂය බලපත්‍ර සංඛ්‍යාව | 2013 වර්ෂය ධාරිතාව (මෙ.වො) | 2014 වර්ෂය බලපත්‍ර සංඛ්‍යාව | 2014 වර්ෂය ධාරිතාව (මෙ.වො) |
|---|---|---|---|---|
| ජල විදුලිය | 10 | 37.8 | 3 | 2.7 |
| සුළං බලය | 1 | 9.8 | 4 | 34.8 |
| ජෛව ස්කන්ධ | 1 | 10.0 | 1 | 5.0 |
| සූර්ය බලය | - | - | 2 | 20.0 |
| තාප(ගල් අඟුරු) | - | - | 1 | 500.0 |
| තාප (ඛනිජ තෙල්) | - | - | 4 | 374.1 |
| | 12 | 57.6 | 15 | 936.6 |

(ඉ) කොමිෂන් සභාව විසින් විදුලි බල නිෂ්පාදනය සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ කටයුතු 2009 වර්ෂයේ ආරම්භ කර තිබූ අතර එම වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා සුළු පරිමාණ විදුලි නිෂ්පාදකයන් සඳහා විදුලි උත්පාදන බලපත්‍ර 201 ක් නිකුත් කර තිබුණද 2014 දෙසැම්බර් 31 දින වන විටත් එම බලපත්‍රලාභීන්ගෙන් 55 දෙනෙකු විදුලි බලය උත්පාදනය කිරීමේ කටයුතු ආරම්භ කර නොතිබුණි.

(ඊ) 2013 වර්ෂයේ නොවැම්බර් වන විට උත්පාදන කටයුතු ආරම්භ කර නොතිබුණු බලපත්‍රලාභීන් සංඛ්‍යාව 71 ක් ලෙස වාර්තා වී තිබුණද, එම බලපත්‍රලාභීන්ගෙන් 14 දෙනෙකු 2013 වර්ෂය අවසන් වන විට උත්පාදන කටයුතු ආරම්භ කර තිබූ බව සමාලෝචිත වර්ෂයේදී කොමිෂන් සභාවට දන්වා තිබුණි. විදුලි උත්පාදන සඳහා වන බලපත්‍රයේ පළමු කොටසේ කොන්දේසි අංක 4 හි සඳහන් පරිදි උත්පාදන කටයුතු ආරම්භ කර දින 30 ක් ඇතුළතදී උත්පාදන කටයුතු ආරම්භ කළ බවට තහවුරු කරන ලද සහතිකයක් බෙදාහැරීමේ බලපත්‍රලාභීන් විසින් ඉදිරිපත් කර නොතිබුණි.

### 4.2 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ .

(අ) 2014 දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවේ අනුමත සේවක සංඛ්‍යාව 45 ක් සහ තථ්‍ය සේවක සංඛ්‍යාව 42 ක් වන අතර පුරප්පාඩු සේවක සංඛ්‍යාව 3 ක් විය.

(ආ) උපදේශන සේවා පහසුකම් ලබා ගැනීම වෙනුවෙන් රු.16,386,528 ක් සමාලෝචිත වර්ෂය තුළ ගෙවා තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 අයවැය ලේඛනමය පාලනය

අයවැය ලේඛන ආදායම්, වියදම් හා තථ්‍ය ආදායම්, වියදම් අතර සියයට 18 සිට සියයට 90 දක්වා සැලකිය යුතු විචලනයන් වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලක කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය

**5.2 නොවිසඳී ඇති විගණන ඡේද**

2011 ඔක්තෝබර් 17 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී මෙන්ම 2012 අගෝස්තු 09 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදීද, 2009 මැයි 26 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 39 අනුව කටයුතු කළ යුතු බවට නියෝග කර තිබුණද එම නියෝග මෙතෙක් ක්‍රියාත්මක කර නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ අවධානයට වරින්වර යොමු කරන ලදී. බලපත්‍ර ගාස්තු හා නියාමන ගාස්තු අයකර ගැනීම සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතුය.